"දෙමළ බසින් - සිංහල බසට භාෂා පරිවර්තනය"

මගේ අංකයඃ NP/19/06/P1/Circular/2017/03

2017.07.19

**චක්‍රලේඛ අංකයඃ 2017/03**

දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරීන්,
සියළුම ග්‍රාම සංවර්ධන නිලධාරීන් / සංවර්ධන නිලධාරීන්,
ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව,
උතුරු පළාත.

**ග්‍රාම සංවර්ධන සමිතිවල සහ කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිවල බැංකු ගිණුම් පවත්වාගෙන යාම.**

(1) මේ වන විට සමිති විසින් නානාප්‍රකාර බැංකුවල විවිධ වර්ගයේ ගිණුම් ආරම්භ කර, තම බැංකු කටයුතු පවත්වාගෙන යමින් පවතී. මේ නිසා සමිති බොහොමයක්, සමිති ව්‍යවස්ථාවේ **උපරීතියේ 12(අ) වැනි වගන්තිය** අනුගමනය නොකර ඇත.

(2) සමිති ව්‍යවස්ථාවේ **උපරීති 12(අ) වැනි වගන්තියට** අනුව සමිතිය තම ඒකකයට ආසන්නව තිබෙන රජයේ බැංකුවක **(ජාතික ඉතිරි කිරීමේ බැංකුව / ලංකා බැංකුව / මහජන බැංකුව)** තැම්පතු ගිණුමක් පවත්වාගෙන යා යුතුය. එයට අනුව සමිතිය විසින්

**(i) චක්‍රීය ණය කටයුතුවල නියැලෙන්නේ නම්, ඒ සඳහාවන තැම්පතු ගිණුමක් ද,**

**(ii) සමිතියේ සාමාන්‍ය කටයුතුවලට (ශිෂ්‍යත්ව කාර්යයන් / සමිතියේ දායක මුදල / සමිති ඉතුරුම් යනාදියට) එක් තැම්පතු ගිණුමක් ද,**

**පමණක් පවත්වාගෙන යාම කළ යුතුය.**

(3) එබැවින්, ලියාපදිංචි කළ සමිතියක් තැම්පතු ගිණුම් එකක් හෝ දෙකක් පමණක් තම සමිතිය ආසන්නයේ වූ අනුමත කළ රජයේ බැංකුවක පවත්වාගෙන යාම කළයුතු බව අනිවාර්යය කරනු ලැබේ.

(4) ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් වෙනසක් සිදු කිරීමට නිසි හේතූන් ඇත්නම්, අධ්‍යක්ෂකවරයා වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර, නිසි අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව, බැංකු කටයුතු සම්බන්ධයෙන් තීරණය කළ යුතු වන්නේය.

ජේ.ජේ.පෙලිසියන්,
අධ්‍යක්ෂ,
ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව,
උතුරු පළාත.

පිටපත්:-

1. ප්‍රධාන ලේකම්, උතුරු පළාත. - **කාරුණික දැන ගැනීම පිණිස.**
2. ලේකම්, ධීවර, ප්‍රවාහන, වෙළෙඳ හා වාණිජ, ග්‍රාම සංවර්ධන, මාර්ග සංවර්ධන හා මෝටර් රථ වාහන ප්‍රවාහන අමාත්‍යාංශය, උතුරු පළාත. - **කාරුණික දැන ගැනීම පිණිස.**
3. දිස්ත්‍රික් ලේකම්, ………………………….. - **කාරුණික දැන ගැනීම පිණිස.**

4. සහකාර විගණකාධිපති, උතුරු ප්‍රාදේශිකය - **කාරුණික දැන ගැනීම පිණිස.**

5. ප්‍රධාන අභ්‍යන්තර විගණකාධි, උතුරු පළාත. - **කාරුණික දැන ගැනීම පිණිස.**

6. ප්‍රාදේශීය ලේකම්, ………………….. - **කාරුණික දැන ගැනීම පිණිස හා මෙහෙයවීම පිණිස.**

7. ප්‍රාදේශීය සමිති හා සංගම්, දිස්ත්‍රික් කාන්තා ග්‍රාම සංවර්ධන සමිති - **දැන ගැනීම පිණිස හා ක්‍රියාත්මක කරලීම පිණිස.**